# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.18 පැය 1615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 86 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ටී 56 ගිනි අවියක් සහ පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.01.11 වන දින වැල්ලම්පිටිය පොලිස් ස්ථානය මඟින් පිස්තෝල අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත රඳවාගෙන වැඩිදුර විමශර්න සිදු කරන ලදී.

එහිදී අනාවරණය වූ තොරතුරු මත තවත් සැකකරුවෙකු 2025.01.14 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමශර්න ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැලිකන්ද ප්‍රදේශයෙදි ටී56 ගිනි අවියක්, එම පතරොම් ගැබක් හා එම ජීව පතරොම් 18 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

ඉහත සැකකරු සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් දින 90 ක රැඳවුම් නියෝග මත වැඩිදුර විමශර්න කටයුතු සිදුකරනු ලබන අතර ඔහුගෙන් අනාවරණය කරගත් තොරතුරු මත රුපියල් ලක්ෂ 02ක මුදලකට තවත් T56 ගිනි අවියක් අලෙවි කර ඇති බවට අනාවරණය කර ගන්නා ලදී .

අනාවරණය කර ගන්නා ලද කරුණු මත කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමශර්න ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් 2025.01.18 වන අද දින වැලිඔය ප්‍රදේශයට ගොස් T56 ගිනි අවිය, පතරොම් ගැබක් හා ජීව පතරොම් 11 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වෙළඳසැලක් පවත්වාගෙන යනු ලබන වයස අවුරුදු 47 ක් වන වැලිකන්ද කාලිංගවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම ගිනි අවිය වෙනත් අපරාධ සඳහා භාවිතා කර ඇති ද යන්න සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

අත්අඩංගුවට ගත් දේපලවල වීඩියෝපටයක් හා ඡායාරූප කිහිපයක්







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**